# දික්වැල්ල ප්‍රාදේශීය සභාව - දික්වැල්ල
## ටෙන්ඩර් දැන්වීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

ටෙන්ඩර්පත් නිකුත් කිරීම :- 2025.03.05 දින පෙ.ව.9.00 සිට 2025.03.18 දින ප.ව.2.00 දක්වා
ටෙන්ර්පත් භාර ගැනීම :- 2025.03.06 දින පෙ.ව 9.00 සිට 2025.03.19 දින ප.ව. 2.00 දක්වා
ටෙන්ඩර්පත් විවෘත කිරීම :- 2025.03.19 දින ප.ව. 2.00 ට දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් නාමය | සෘජු ඉදිකිරීම් පිරිවැය (අවිනිශ්චිත හැර) රුපියල් මිලියන | කොන්ත්‍රාත් කාලය | CIDA ශ්‍රේණිය | ලංසු ඇපකරය (රුපියල්) | ආපසු නොගෙවන ගාස්තු (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|
| 01 | DPS/DEV/02/CF/01/2025 | මානගල්ලගෙවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 1.5 | දින 60 | C9 සහ C8 | 15,000.00 | 2,000.00 |
| 02 | DPS/DEV/02/CF/02/2025 | හුන්නදෙනිය සිසිල උයන මාර්ගය සංවර්ධනය කිරීම. | 1.4 | දින 60 | C9 සහ C8 | 14,000.00 | 1,500.00 |
| 03 | DPS/DEV/02/CF/03/2025 | හෙට්ටියගෙආර මාර්ගය සංවර්ධනය කිරීම. | 0.8 | දින 60 | C9 සහ C8 | 8,000.00 | 1,000.00 |
| 04 | DPS/DEV/02/CF/04/2025 | බෝගහකොරටුව සඳලුව මාර්ගය සංවර්ධනය කිරීම. | 1.3 | දින 60 | C9 සහ C8 | 13,000.00 | 1,500.00 |
| 05 | DPS/DEV/02/CF/05/2025 | කටුගහගෙවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 2.6 | දින 60 | C8 සහ C7 | 26,000.00 | 3,000.00 |
| 06 | DPS/DEV/02/CF/06/2025 | උඩදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම. | 2.1 | දින 60 | C8 සහ C7 | 21,000.00 | 2,500.00 |
| 07 | DPS/DEV/02/CF/07/2025 | කුරුඳුහේන මාර්ගය සංවර්ධනය කිරීම. | 1.8 | දින 60 | C9 සහ C8 | 18,000.00 | 2,000.00 |
| 08 | DPS/DEV/02/CF/10/2025 | දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මායිම් තාප්පය සකස් කිරීම | 3.5 | දින 60 | C8 සහ C7 | 35,000.00 | 4,000.00 |
| 09 | DPS/DEV/02/CF/12/2025 | අලුත්වත්ත ප්‍රජා මාවත සංවර්ධනය කිරීම. | 1.3 | දින 60 | C9 සහ C8 | 13,000.00 | 1,500.00 |
| 10 | DPS/DEV/02/CF/13/2025 | ගමගේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 1.4 | දින 60 | C9 සහ C8 | 14,000.00 | 1,500.00 |
| 11 | DPS/DEV/02/CF/14/2025 | ඉහළමුල්ල මීමනදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම. | 1.4 | දින 60 | C9 සහ C8 | 14,000.00 | 1,500.00 |
| 12 | DPS/DEV/02/CF/15/2025 | උණුපැන්දෙනිය දොළහේන මාර්ගය සංවර්ධනය කිරීම. | 1.4 | දින 60 | C9 සහ C8 | 14,000.00 | 1,500.00 |
| 13 | DPS/DEV/02/CF/17/2025 | පැලවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 1.8 | දින 60 | C9 සහ C8 | 18,000.00 | 2,000.00 |
| 14 | DPS/DEV/02/CF/18/2025 | රණලිය මාවත සංවර්ධනය කිරීම. | 1.8 | දින 60 | C9 සහ C8 | 18,000.00 | 2,000.00 |
| 15 | DPS/DEV/02/CF/19/2025 | දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ කාර්යාල කාමර වෙන් කිරීම. | 1.1 | දින 60 | C9 සහ C8 | 11,000.00 | 1,500.00 |
| 16 | DPS/DEV/02/CF/20/2025 | ඉහළමුල්ල රදම්පල මාර්ගය සංවර්ධනය කිරීම. | 4.6 | දින 60 | C8 සහ C7 | 46,000.00 | 5,000.00 |

- පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2025.03.14 වන සිකුරාදා දින පෙ.ව. 10.00 ට දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පැවැත්වේ.

චාන්දනී වේරගොඩ,
ලේකම්/ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කිරීමේ නිලධාරී,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව

දු.අ. 041 2255275

**ටෙන්ඩර් උපදෙස්**

1. සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම කවර දෙකක **මුල් පිටපත** හා **දෙවන පිටපත** ලෙස සඳහන් කර මුද්‍රා තබා එකම කවරයක බහා නැවත මුද්‍රා තබා **දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්** වෙත ලැබෙන සේ යොමු කල යුතුය. නොඑසේ නම් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. **සියළුම ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය. ටෙන්ඩරය බහාලන මුද්‍රා තබන ලද කවරයේ **වම්පස උඩ කෙලවරෙහි කර්මාන්තයේ නම** සඳහන් විය යුතු අතර, එය 2025.03.19 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත එවිය යුතුය.

2. සෑම ටෙන්ඩර්කරුවෙකු විසින්ම ආපසු ගෙවන ලද ටෙන්ඩර් තැන්පත් මුදල දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කර ලබාගත් **ලදුපත මුල් පිටපතේ අමුණා තිබීම** අනිවාර්ය වේ. එසේ නොකර පසුව ඉදිරිපත් කරන ලදුපත් සඳහා තැන්පත් මුදල් ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩරය සඳහා ඉල්ලුම් කල යුත්තේ 2025.03.05 දින පෙ.ව.9.00 සිට 2025.03.18 දින ප.ව. 2.00 දක්වා කාලය තුල නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර මඟින් පමණක් වේ.

4. පිළිගත් ආකෘති පත්‍රය මඟින් ඉදිරිපත් කරනු නොලබන හෝ මෙහි සඳහන් කර දක්වා ඇති කොන්දේසි හා අවශ්‍යතාවයන්ට තරයේ අනුකූල නොවන කිසිදු ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

5. ටෙන්ඩර් ලියවිලි වල කිසිදු වෙනස් කිරීමක් හෝ මකා දැමීමක් කරනු ලැබුවේ නම්, ඒ සෑම ස්ථානයක් ම ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන යොදා සහතික කල යුතුය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනුයේ ටෙන්ඩර් පෝරම ගාස්තු ගෙවීම වෙනුවෙන් ලබාගත් ලදුපත එකී පුද්ගලයා විසින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

7. කවර හෝ ටෙන්ඩර්කරුවෙක් කොන්ත්‍රාත්තුව හා ගිවිසුම අත්සන් කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ ටෙන්ඩරය පිළිගත් බව සඳහන් ලිඛිත නිවේදනයක් ලැබීමෙන් දින 10 ක් තුළ අනුමත කරන ලද ඇප මුදල ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, එකී තැන්පත් මුදල සභාව සතු කරනු ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරු විසින් සඳහන් කර ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබ ඇත්නම් හෝ එකී ලිපිනය වෙත භාරදී ඇත්නම් හෝ එකී දැන්වීම එම ටෙන්ඩර්කරු වෙත ලැබී ඇති බවට සලකනු ලැබේ.

8. කොන්ත්‍රාත්තුව සඳහා අවශ්‍ය ආරක්ෂිත ඇප මුදල් ප්‍රමාණය කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 5% හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලද මුදල දික්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

9. ටෙන්ඩර්කරුවෙකු ලෙස තමා තෝරා ගතහොත් තමා විසින් ඇතුළත් විය යුතු ගිවිසුම් පිළිබඳව විස්තර සඳහන් කොන්ත්‍රාත් ගිවිසුම් ආකෘති පත්‍රය ටෙන්ඩර්කරුවන් විසින් ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගෙන ඉතා සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කල යුතු අතර, අවශ්‍ය වේ නම් ප්‍රාදේශීය සභා කාර්යාලය වෙතින් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ලබා ගත යුතුය.

10. ටෙන්ඩරය අහිමි වූ ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් අනතුරුව ආපසු ගෙවනු ලැබේ.

11. නිසි පරිදි දෙන ලද අවසරයකින් තොරව කිසිදු කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීමට හෝ අතුරු බදු දීමට නොහැකිය.

12. ටෙන්ඩරය පිරිනමන දින ටෙන්ඩර්කරු විසින් දික්වැල්ල ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

13. පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2025.03.14 වන සිකුරාදා දින පෙ.ව.10.00 ට දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පැවැත්වේ. එහිදී ටෙන්ඩර් කර ඇති කර්මාන්තවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරී මහතාගෙන් විමසීම් කල හැකිය.

14. 2025.03.19 දින දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ප.ව.2.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

චාන්දනී වේරගොඩ,<br>
ලේකම්/ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කිරීමේ නිලධාරී,<br>
දික්වැල්ල ප්‍රාදේශීය සභාව